Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

08 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S I

ඉතිහාසය I | කාලය පැය 2 විනාඩි 15

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

• අංක 1 - 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සාහිත්‍ය මූලාශ්‍ර වලට අනුව ශ්‍රී ලංකාවේ මුල්ම දාගැබ වන ථූපාරාමය ඉදිකරන ලද්දේ,
 01. වලගම්බා රජුය 02. මහසෙන් රජුය 03. දේවානම්පියතිස්ස රජුය. 04. දුටුගැමුණු රජුය

02. කෙත්වල ජලය ලබා ගැනීම සඳහා ඇළ දොළ හරස් කර බඳින ලද ''ආවරණ'' බැම්ම හඳුන්වනනේ,
 01. වේල්ලකි 02. අමුණයි 03. සොරොව්ව 04. පිටවාන

03. වර්තමානයේ මහනුවර යුගයේ චිත්‍ර දැකිය හැකි ස්ථානයක් නොවන්නේ,
 01. මුල් කිරි ගල 02. දඹුල්ල 03. දෙගල්දොරුව 04. මහියංගනය

04. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ රාජ්‍ය කාලය වන්නේ,
 01. 1798 - 1815 02. 1782 - 1798 03. 1782 - 1815 04. 1747 - 1782

05. පුනරුද සමයේ කලා කටයුතු වලට අතදුන් ''මෙඩිසි'' පවුල් සිටි නගරය කුමක්ද?
 01. වැනීසිය 02. ෆ්ලෝරන්ස්
 03. ජිනෝවා 04. කොන්ස්තන්තිනෝපලය

06. 14 හා 16 වන සියවස් වලට බිහි වූ ගත් කතුවරුන් වන ඩාන්ටේ, විලියම් ෂේක්ස්පියර්, ඉරාමස් ජීවත් වූ රටවල් අනුපිළිවෙලින් දැක්වෙන්නේ,
 01. එංගලන්තය, ඉතාලිය, ප්‍රංශය 03. ඉතාලිය, ප්‍රංශය, එංගලන්තය
 02. එංගලන්තය, ප්‍රංශය, ඉතාලිය 04. ඉතාලිය, එංගලන්තය, ප්‍රංශය

07. 16 වන සියවසේ ලන්දේසීන්ගේ පෙරදිග මූලස්ථානය නිවැරදිව දැක්වෙන්නේ,
 01. පොන්ඩිචෙරි 02. මධුරාසිය 03. බතාවිය 04. කැලිකට්

08. දේශ ගවේශන කටයුතු වලදී උතුරු ඇමරිකාවේ ශාන්ත ලෝරන්ස් ප්‍රදේශය සොයාගත් පුද්ගලයා කවුරුන්ද?
 01. ජැක්විස් කාටියර් 02. ෆර්ඩිනැන්ඩෝ කෝටේස් 03. හෙන්රි හඩ්සන් 04. කැබේ සහෝදරයෝ

09. මහනුවර රාජධානි සමයේ පෘතුග්‍රීසීන් යටතේ දොන් ජුවන් නමින් බෞතීස්ම ලැබූ පුද්ගලයා කවරෙක්ද?
 01. ධර්මපාල කුමරු 02. කොනප්පු බණ්ඩාර
 03. වීර සුන්දර බණ්ඩාර 04. යමසිංහ බණ්ඩාර

10. අනුරාධපුර යුගයේ මහායාන අදහස් ප්‍රචලිත කිරීම සඳහා ඉදිකළ බෝධිසත්ව ප්‍රතිමාව තිබෙන ස්ථානය වන්නේ,
 01. යටාල වෙහෙර 02. උත්තරාරාමය 03. කඹරගල 04. වෙහෙරගල

11. සීගිරි චිත්‍ර වල ස්ත්‍රී රූප පැළඳ සිටින අනුමාන මල් වර්ග මොනවාද?
 01. ඕලු, නෙළුම්, මානෙල් 02. මානෙල්, උපුල්, කඩුපුල්
 03. නෙළුම්, උපුල්, සපු 04. උපුල්, නෙළුම්, කඩුපුල්

12. පොළොන්නරු අවධියේ සඳකඩ පහනින් ඉවත් වූ සත්ව රූපය කුමක්ද?
 01. සිංහයා 02. හස්තියා 03. අශ්වයා 04. වෘෂභ

13. පැරණි ගෘහ නිර්මාණ අතර ආගමික ගොඩනැගිල්ලක් නොවන්නේ,
 01. රජ මාලිගා 02. දේවාල 03. දාගැබ් 04. දාන ශාලා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

14. අතීත කර්මාන්ත අතර ''කබර'' නමින් හඳුන්වා ඇත්තේ,

01. බෙලෙක් වැඩ කරන්නන්   02. තඹ වැඩ කරන්නන්
03. ලෝහ වැඩ කරන්නන්   04. රන් වැඩ කරන්නන්

15. මධ්‍යම නුවර ගම් පළාතේ ගල් කඩවල ප්‍රදේශය ප්‍රසිද්ධ වන්නේ,

01. දෙමළ සෑය ඇති බැවිනි   02. රන් කැබලි හමු වූ බැවිනි
03. ගඩොල් පෝරණුවක් තිබූ බැවිනි   04. යකඩ නිස්සාරණ කළ බැවිනි

16. වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනමන ලද රජු වන්නේ,

01. ශ්‍රී විජය රාජසිංහ රජු   02. කීර්ති ශ්‍රී රාජසිංහ රජු
03. රාජාධිරාජ සිංහ රජු   04. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

17. ''විජය බා කොල්ලය'' නමින් හඳුන්වන දේශපාලන සිදුවීම ඇති වූ වර්ෂය වන්නේ,

01. 1505 දී   02. 1514 දී   03. 1518 දී   04. 1521 දී

18. දහසය වන සියවසේ මුල් කාලයේ උඩරට රාජධානියට යටත්ව තිබූ ප්‍රදේශ නිවැරදිව දැක්වෙන්නේ,

01. මාතලේ, තමන්කඩුව, ත්‍රිකුණාමලය   03. මාතලේ, රයිගම, සීතාවක
02. සෙංකඩගල, සීතාවක, රයිගම   04. සෙංකඩගල, කෝට්ටේ, සීතාවක

19. කුඩා ප්‍රමාණයේ දාගැබක් ආවරණය කිරීමට සකස් කළ ගර්භය හඳුන්වන්නේ,

01. බෝධිඝරය   02. පිළිම ගෙවල්   03. චෛතිය  ඝර   04. ලෙන්

20. පළමුවන අග්ගබෝධි රජු මහවැලි ගඟේ සිට ජලය ගෙන යාමට තැනූ ඇල කුමක්ද?

01. ඇළහැර ඇල   02. තල්වතු ඇල   03. යෝධ ඇල   04. මිනිපේ ඇල

- **අංක 21 - 25 දක්වා වූ ප්‍රශ්න වලට හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න**

(පොළොන්නරුව, කිරි වෙහෙර දාගැබ, ශ්‍රී වික්‍රම රාජසිංහ, කණ්ඨක චෛත්‍ය, රාජාධිරාජසිංහ රජු, 1453, 1492, සොරොව්ව, තෝම්බු, මහ බැද්දේ, බිසෝ කොටුව)

21. රජරට සමයට අයත් විශිෂ්ඨතම වාහල්කඩ .................................... නැගෙනහිරින් හමුවේ.

22. බ්‍රිතාන්‍ය රජයේ අත්අඩංගුවට පත් වූ .................................... රජු වෙල්ලෝරයට රැගෙන යන ලදි.

23. .................................... වර්ෂයේදී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අත්පත් කර ගැනීම.

24. වැවේ ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනෙන්නේ .................................... මගිනි.

25. පෘතුග්‍රීසි පාලන සමයේ ඉඩම් පිළිබඳ තොරතුරු සොයන ලේඛනය .................................... යනුවෙන් හැඳින්වේ.

- **අංක 26 - 30 දක්වා වූ ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (X) ලකුණද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.**

26. සීතාවක රාජධානි සමයේ බැරැන්ඩි කෝවිල ඉදි කරන ලදි. (   )
27. කෝට්ටේ රාජධානියේ පාලකයා පළමුවෙනි රාජසිංහ රජුය. (   )
28. පුනරුද සමයේ ප්‍රංශ ගත්කතුවරයෙකු ලෙස ඉරාමස් පෙන්වා දිය හැක. (   )
29. සීගිරියේ ජල උද්‍යානයේ එච්.ඩී.වී.බෙල් මහතා හා සෙනරත් පරණවිතාන මහතා යලි සොයා ගන්නා ලදි. (   )
30. මනාලයා මනාලියගේ නිවසේ පදිංචි වීම දීග විවාහය නම් වේ. (   )

( ලකුණු 30)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යයි.**
- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (අ) ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.
1. කොට්ටේ 2. ත්‍රිකුණාමලය 3. සෙංකඩගල 4. කලා ඔය ( ලකුණු 4 )

(ආ) ඔබට සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.
1. රතු මුහුද 2. රෝමය 3. මලක්කා සමුද්‍ර සන්ධිය ( ලකුණු 3 )

(ඉ) පහත සඳහන් රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A I මෙම රූපයේ දැක්වෙන පුද්ගලයාගේ නම කුමක්ද?
II මොහු කුමන ජාතිකයෙක්ද?
III මොහු කෝට්ටේ රාජධානි සමයේ ඇති කරගත් ගිවිසුමේ නම කුමක්ද?

B I මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?
II මෙය තිබූ ස්ථානයේ නම කුමක්ද?
III මෙම ස්ථානය හා සම්බන්ධ රජතුමා කවුද?


A


B

02. I පහත සඳහන් දාගැබ් ඉදි කළ රජවරු නම් කරන්න.
I අභයගිරිය - ............................
II රන් කොත් වෙහෙර - ................................ (ලකුණු 6)

II චෛත්‍යයක දක්නට ලැබෙන ප්‍රධාන අංග 03 ලියන්න. (ලකුණු 3)

III පිළිම ගෙවල් ඉදිකරන ප්‍රධාන සම්ප්‍රදායන් 02 නම් කොට ඒවා වෙන වෙනම විස්තර කරන්න. (ලකුණු 6)

03. I මහනුවර රාජධානිය හඳුන්වන නම් 02 ක් ලියන්න. (ලකුණු 2)

II උඩරට රාජධානි සමයේ ආනයනය කල භාණ්ඩ 03 ලියන්න. (ලකුණු 3)

III උඩරට රාජධානියේ පැවති කෘෂිකර්මයට නිදසුන් සහිතව කෙටියෙන් ලියන්න. (ලකුණු 6)

04. I පහත සඳහන් සිතුවම් නිර්මාණය කල පුද්ගලයන්ගේ නම් ලියන්න.
I මොනාලිසා ............................
II අවසාන විනිශ්චය ................................... (ලකුණු 2)

II පුනරුදය ඇති වීමට බලපෑ හේතු 03 ක් ලියන්න. (ලකුණු 3)

III පුනරුද සමයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුවට බල පෑ පුද්ගලයන් දෙදෙනෙකු ලියා ඔවුන් සොයා ගත් දෑ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

05. I දේශගවේශන කටයුතු වලට සහාය දුන් රටවල් 02 ක් ලියන්න. (ලකුණු 2)

II යුරෝපීයන් ආසියාතික රටවලට පැමිණීමට බල පෑ අරමුණු 03 ලියන්න. (ලකුණු 3)

III පහත සඳහන් පුද්ගලයන් තිදෙනාගෙන් දෙදෙනෙක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.
I නාවික හෙන්රි
II ෆර්ඩිගන් මැගලන්
III බර්තලමියුඩයස් (ලකුණු 6)

06. I පෘතුගීසින් පරාජයට පත් කල සටන් 02 ලියන්න. (ලකුණු 2)

II සීතාවක රාජධානිය පිරිහීමට බල පෑ කරුණු 03ක් ලියන්න. (ලකුණු 3)

III පෘතුගීසින්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට බල පෑ කරුණු 02 විස්තර කරන්න. (ලකුණු 6)

07. I ශ්‍රී ලංකාව තුළ ආදායම් එකතු කිරීමට පත් කල සුළු නිලධාරීන් දෙදෙනෙක් ගේ නම් ලියන්න. (ලකුණු2 )

II පෘතුගීසින්ගෙන් මෙරට සංස්කෘතියට එකතු වූ නවාංග 03 ලියන්න. (ලකුණු 3)

III පෘතුගීසින් ලාංකික සමාජය තම ආගමට හරවා ගැනීමට ගත් උපක්‍රම 02 ක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
## ඉතිහාසය - පිළිතුරු පත්‍රය

**8 ශ්‍රේණිය**

I පත්‍රය

| | | |
|---|---|---|
| 1. 3 | 11. 3 | 21. කණ්ඨක චෛත්‍ය |
| 2. 2 | 12. 4 | 22. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු |
| 3. 4 | 13. 1 | 23. 1453 |
| 4. 1 | 14. 3 | 24. බිසෝකොටුව |
| 5. 2 | 15. 3 | 25. තෝම්බු |
| 6. 4 | 16. 2 | 26. ✓ |
| 7. 3 | 17. 4 | 27. X |
| 8. 1 | 18. 1 | 28. ✓ |
| 9. 2 | 19. 3 | 29. ✓ |
| 10. 1 | 20. 4 | 30. X |

II කොටස

01. (i) A I දොන් ජෙරොනිමො ද අස්වේදා
II පෘතුගීසි ජාතිකයෙක්
III මල්වානේ ගිවිසුම

B I කුරහන් ගල
II කුරුවිට දෙල්ගමුව විහාරය
III පළමු විමලධර්මසූරිය රජතුමා

02. I 1. වලගම්බා රජු 2. නිශ්ශංක මල්ල රජු
II පාදම, පේසා වලල, ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල
III ගන්ධ කුටි
- ප්‍රතිමා තැන්පත් කොට ඇති කොටස ගර්භ ගෘහය වේ.
- ජනතාව දැක බලා ගන්නා ස්ථානය මණ්ඩපය වේ.
- නිදසුන්- කිරිබත් වෙහෙර, විජයාරාම, පංකුලිය, තොලුවිල.

ගෙඩිගේ පිළිම ගෙවල්
I ● බිත්ති හෝ පියස්ස ගඩොල් හෝ ගලින් නිර්මාණය කර ඇත.
II ● මෙම සම්ප්‍රදාය දියුණු වූයේ පොළොන්නරු යුගයේදීය.
III ● ථූපාරාමය, ලංකාතිලකය

ලෙන් විහාර
I ● සැතපෙන ඉරියව් නිර්මාණය කර ඇත.
II ● පිදුරංගල, හැබැස්ස, හුලංහුගේ

03. I කන්ද උඩරට, කන්දේ නුවර, සෙංකඩගල පුර
II පිඟන් භාණ්ඩ, රෙදි පිළි, මැටි බඳුන්, සුවඳ වර්ග, කරවල
III හේන් ගොවිතැන ⋆ කුරක්කන්, මෙනේරි, තල, ඉරිඟු වගා කරන ලදී.
මඩ ගොවිතැන ⋆ හෙල් මළු ක්‍රමය, අහස් දියෙන් වගා කිරීම

04. I ලියනාඩෝ ඩාවින්චි II මයිකල් ආන්ජලෝ
II ● කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අල්ලා ගැනීම
● වෙළඳාම දියුණු වීම ● බුද්ධි ප්‍රබෝධය

III ● නිකලස් කොපර්නික් ● ජොහැන්ස් කෙප්ලර්
● විලියම් හාවි ● වෛද්‍ය පැරසල්පස් ● මයිකල් සර්වෙටස්

05 I ● පෘතුගාලය, ස්පාඤ්ඤය , එංගලන්තය
II කුළු බඩු, මුස්ලිම් වෙළඳ ඒකාධිකාරය යුරෝපීන් ලබා ගැනීම, ආගම ප්‍රචාරණය
III නාවික හෙන්රි- ● නාවික පාසල ආරම්භ කිරීම ● දේශගවේශන කිරීම
ෆර්ඩිනන් මැගලන් - ● පැසිපික් සාගරයට පිවිසීම.

06. I දන්තුරේ, බලන, රන්දෙණිවෙළ, ගන්නෝරුව
II ● බෞද්ධ විරෝධි ප්‍රතිපත්ති, වීරසුන්දර බණ්ඩාර මැරවීම, සීතාවකට නිසි උරුමක්කාරයෙක් නොසිටිම ( රාජසිංහ රජුගෙන් පසු)
III උඩරටියන් ගේ සටන් උපක්‍රම, රජුට පක්ෂපාති වීම, උඩරට අභිමිවීම, උතුරු ආක්‍රමණ වලදී උඩරට ජනතාව රජුට සහයෝග දැක්වීම

07. I කනකපුල්ලේ, ලියන්නන් මයෝරාළවරුන් II පුද්ගල පෙළපත් නාම, ආහාර, ඇඳුම් පැළඳුම්, කලාව සංගීතය
III ● කතෝලික ආගම වැළඳගත් අයට වරප්‍රසාද දීමනා, තනතුරු දීම ● බදු වලින් නිදහස් ● අධ්‍යාපනය ලබා දීම
● ශුභ සාෂන පහුසුකම් ● ගම් වල චිත්‍ර ශිල්ප කටයුතු